**ජපන් තානාපති කාර්යාලය**
අංක 20, ග්‍රෙගරි පාර, කොළඹ 7
දුරකථන : +94-11-2693831~3, ෆැක්ස් : +94-11-2698629
ඊමේල් : cultujpn@co.mofa.go.jp

## පුවත්පත් නිවේදනය

දෙසැම්බර් 21, 2011

## අම්පාර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය සංවර්ධන කටයුතු සඳහා ජපන් රජයෙන් ආධාර

ජපන් රජය මගින් අම්පාර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය සංවර්ධන කටයුතු සඳහා ඩොලර් 42,055 (දළ වශයෙන් රුපියල් මිලියන 4.7 ක්) ප්‍රදානය කරන ලදි. මෙම ව්‍යාපෘතිය උහන දිස්ත්‍රික් ලේකම් කොට්ඨාශයේ ගම්මාන තුනක යටිතල පහසුකම් කෘෂිකාර්මික කටයුතු සහ ජිවන තත්වයන් මෙන්ම ජිවනෝපායන් නගා සිටුවීම සඳහා සැලසුම් කර ඇත. තමම ව්‍යාපෘතිය මගින් නල ළිං 7ක් හා දුෂ්කර පාසැල් දෙකක් සඳහා ජල ව්‍යාපෘති 2ක් ඉදිකරන අතර කෘඹිකාර්මික පුහුණු වැඩ සටහන් සහ මී මැසි පාලනය සඳහා අවශ්‍ය උපකරණ ලබාදීම ද සිදු කරනු ඇත.

'පෙරගමන ගිල්ඩ්' ආයතනය විසින් මෙම ව්‍යෘපෘතිය දියත් කරන අතර ඒ හරහා පවුල් 170කට සහ පාසැල් ළමුන් හා ගුරුවරුන් 600කට ප්‍රතිලාභ ලැබෙනු ඇත. බිම් මට්ටමේ මානව සුරැකීමේ ආධාර ව්‍යාපෘතිය (GGP) යටතේ මෙම ව්‍යාපෘතිය සඳහා ආධාර ලබා දෙන අතර ඒ තුලින් ප්‍රජාවගේ ජිවන මට්ටම සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහල නැංවෙනු ඇතැයි බලාපොරොත්තු වේ. 1989 වසරේ සිට මේ දක්වා බිම් මට්ටමේ මානව සුරැකීමේ ආධාර ව්‍යාපෘතිය (GGP) යටතේ මෙවැනි ව්‍යාපෘති 225ක් සඳහා ඩොලර් මිලියන 29.3 ක (දළ වශයෙන් රුපියල් මිලියන 3,300 ක) ආධාර ලබාදී ඇත.

මෙම ප්‍රදානය සම්බන්ධයෙන් ‘පෙරගමන ගිල්ඩ්’ ආයතනයේ සභාපතිනි ධර්මා එස්. සමරනායක මහත්මිය පැවසුවේ අම්පාර උහන දිස්ත්‍රික් ලේකම් කොට්ඨාශයේ ඉහලම දරිද්‍රතාවයකින් පෙළෙන මෙම ගම්මාන තුනෙහි ජනතාවට වසර ගණනාවක් පුරාවටම බීමට ලැබුනේ අපිරිසිදු ජලය පමණි. නමුත් ජපන් තානාපති කාර්යාලය දැක්වූ කාරුණික අනුග්‍රහය නිසා මෙම ජනතාවට ජිවිතයේ මුල්ම වරට ලබන වසරේ සිට පිරිසිදු ජලය පානය කිරීමට අවස්ථාව උදා වනු ඇත. පෙරගමන ගිල්ඩ් ආයතනයේ කාර්ය මණ්ඩලයත් උහන ජනතාවත් මෙම ව්‍යාපෘතිය සඳහා ආධාර ලබාදිම වෙනුවෙන් ජපන් රජයට බොහෝ සේ කෘතඥ පූර්වක වන බවද පැවසීය.

සංවර්ධනයේ දැවැන්ත සහකරුවකු ලෙස ජපානය, ශ්‍රී ලංකාවේ සාමාජයීය ආර්ථික සංවර්ධනය සඳහා රජය සමග මෙන්ම රටේ ජනතාව සමග ද අත්වැල් බැඳගෙන සිටී. ජපානයේ සංවර්ධන ඉතිහාසය සලකා බැලිමේදී, ග්‍රාමීය සංවර්ධනය මුළු රටේම සංවර්ධනයෙහිලා අත්‍යවශ්‍ය අංගයක් බව පැහැදිලිය. එසේම මෙම ව්‍යාපෘතියත් අදාල ප්‍රාදේශයන්හි සංවර්ධනය සඳහා මහත් පිටුවහලක් වන අතර ජාතික සංවර්ධනය නගා සිටුවීමටද මූලිකත්වයක් ගනු ඇතැයි බලාපොරොත්තුවේ.

ජපන් තානාපති නොබුහිතෝ හොබෝ මහතාත්, ආධාර ලබාගැනිම සම්බන්ධව ‘පෙරගමන ගිල්ඩ්’ ආයතනයේ සභාපතිනි ධර්මා එස්. සමරනායක මහත්මියත් අතර, මෙම අධාර ප්‍රදානය කිරීමේ ගිවිසුම, 2011 දෙසැම්බර් මස 21 වන දින තානාපති නිල නිවසේදී අත්සන් කරන ලදි,


වැඩි විස්තර සඳහා, කරුණාකර විමසන්න

ආර්ථික සහයෝගිතා අංශය, ජපන් තානාපති කාර්යාලයය

දූරකථන 011-2693831 දිගු අංකය 225

ඊ මේල් : cultujpn@co.mofa.go.jp